**ආණමඩුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු ගබඩා ගිණුමෙන් මාරුකර තිබූ රු.410,750 ක සැපයුම් හා උපකරණ සැපයුම් හා උපකරණ ගිණුමට හර කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාලව පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ලැබියයුතු රු.968,338 ක් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ලැබී තිබූ සුනබ තැන්පතු ආදායම් රු.239,920 ක් තැන්පතු ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) 2017 වර්ෂයට අදාල රු.246,768 ක මුද්දර ගාස්තු ආදායමක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ රු.12,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ප්‍රාග්ධන ආධාර රු.5,000,000 ක් සමුච්චිත අරමුදලට බැරකර තිබීම හේතුවෙන් එම වටිනාකමින් ප්‍රාග්ධන ආධාර අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට රු.59,152,954 ක්වූ ලැබිය යුතු ගිණුම් 08 කින් වර්ෂ 03 කට වඩා වැඩි රු.3,205,655 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට රු.22,703,227 ක්වූ ගෙවිය යුතු ගිණුම් 9 කින් වර්ෂ 03 ට වැඩි කාලයක් තුල නොගෙවා තිබෙන රු.2,999,060 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 | 5,853,890 | සභා බලප්‍රදේශයේ වරිපනම් බදු ගෙවීම පැහැර හරින තැනැත්තන්ට අයත් දේපල තහනම් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 572 (1) | 354,150 | කල් ඉකුත් තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,180,393 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.59,848,724 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------------- | -------- | -------- | -------- | -------- | -------- | -------- | -------- | -------- |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,113 | 5,015 | 3,663 | 6,287 | 4,970 | 5,017 | 3,576 | 4,935 |
| කුලී | 14,159 | 10,840 | 10,384 | 1,839 | 12,668 | 9,817 | 10,530 | 1,383 |
| බලපත්‍ර ගාස්තු | 1,438 | 1,005 | 1,005 | - | 837 | 1,305 | 1,305 | - |
| වෙනත් ආදායම් | 15,325 | 10,377 | 10,205 | 12,663 | 10,740 | 11,611 | 5,300 | 9,359 |

සටහන :- රැස්කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් අයකිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමින් අයකිරීම් ඇතුළත්වේ.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

---------------------------------------

පසුගිය වර්ෂවල හිඟ ආදායම් සමග ලැබිය යුතු සමස්ථ වරිපනම් හා බදු ආදායමින් සියයට 36 ක් හා කුලී ආදායමින් සියයට 85 ක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂය අවසානයට එකතුව රු.4,935,000 ක් වූ වරිපනම් හා බදුවල හිඟය සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.6,287,000 ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව බදු එකතුකිරීම පිළිබඳ වගකීම සභාව විසින් ඉටුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කල රු.4,959,647 ක් වූ වරිපනම් බදු මුදලින් වර්ෂය තුලදී රැස්කර තිබුණේ සියයට 50 කට සමාන රු.2,482,569 ක් පමණි

**2.2.4 කුලී**

--------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුලී සහ බදු කුලී හිඟ ආදායම් සමග සමාලෝචිත වර්ෂයේදී සියයට 85 ට සමාන රු.10,384,000 ක් රැස්කරගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.432,008 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු. 4,724,255 ක් වූ උසාවි දඩ සහ රු. 6,103,308 ක් වූ මුද්දර බදු අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 29 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

--------------------------

2017 වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව සලසා තිබෙන ප්‍රතිපාදන වලින් සෞඛ්‍ය, සනීපාරක්ෂක හා පරිසර කටයුතු සහ අපද්‍රව්‍ය කළමනාකරණ වියදම් සියයට 10 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

2017 වාර්ෂික සංවර්ධන සැලැස්මට අනුව සහා අරමුදලින් සපයන සේවාවන් ලෙස සඳහන් කර තිබූ රු.100,000 ක් වූ ව්‍යාපෘතියක් ඉටු කර නොතිබූ අතර, ව්‍යාපෘති 06 ක් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 5 සිට සියයට 88 දක්වා පරාසයක විය.

(ඈ) අත්හැරදැමූ කර්තව්‍යයන්

----------------------------

2017 වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් රු.7,500,000 ක් වූ පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සභා බල ප්‍රදේශයේ දෛනිකව ටොන් 02 ක පමණ කසළ ප්‍රමාණයක් එකතුවන අතර එය උපයෝගී කරගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා 2011 වර්ෂයේදී රු.3,256,000 ක් වැයකර සභාව පිටුපස කසළ අංගනයක් ආරම්භ කර තිබුණද එය 2017 දෙසැම්බර් 31 වන විට අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි. 2013 සිට 2016 දක්වා පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.2,456,334 ක් වැයකර තවත් කසළ අංගනයක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" යටතේ ජංගම සේවා පැවැත්වීම, මානව සම්පත් කළමනාකරණය, සේවක අභිප්‍රේරණය මෙන්ම මංමාවත් සංවර්ධනය ඇතුළු මහජන යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමුකර තිබුණි. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

සභාවේ ද්විතීයික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 08 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 07 ක් පැවති අතර, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනියම්/ ආදේශක තනතුරුවල 07 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**නිශ්ක්‍රීය වත්කම්**

**-------------------**

2010 සිට 2016 දක්වා කාලය තුල විවිධ වර්ගවලට අයත් වාහන 04 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**--------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**-------------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**

**-----------------------**

සභාවේ නිලධාරියෙක් අභ්‍යන්තර විගණන කටයුතුවල නිරත කරවා 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් නිකුත් කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

**--------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සැපයුම් සහ සේවා සඳහා සලසා තිබුණු රු.3,644,138 ක්වූ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල රු.1,165,439 ක් පමණක් වැයකර තිබුණි.

(ආ) ආහාර පාන හා නිල ඇඳුම් වලින් සියයට 51 ක්ද, වෛද්‍ය සැපයීම් වලින් සියයට 70 ක්ද, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වලින් සියයට 85 ක්ද, ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ගොඩනැගිලි ඉදිකිරීම් වලින් සියයට 100 ක්ද වශයෙන් ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ආදායම් රැස්කිරීම | හිඟ ආදායම් රැස්කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි පියවරගෙන නොතිබුණි. |
| (ආ) වත්කම් කළමනාකරණය | නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඇ) සේවක මණ්ඩල | පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) තිරසර සංවර්ධනය | අරමුණු/ ඉලක්ක සඳහා වූ දර්ශක හඳුනාගෙන නොතිබුණි. |